## ශීර්ෂය 24 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

-----------------------------------

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට **ජාතික** ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

-------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. ඒ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(ඇ)(2) ව්‍යවස්ථාව** | කොමිෂන් සභාව විසින් ඉටුකල යුතු කාර්යයන් අතර ලංසුකරුවන්ට ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගිවීම පිණිස සමාන අවස්ථාවන් ලබාදී ඇද්ද යන්න නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරිම මෙන්ම ප්‍රසම්පාදනයන්ට සම්බන්ධ සැපයුම් කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ට යෝග්‍ය පරිදි සුදුසුකම් තිබේද යන්න පිළිබඳ වාර්තා කිරීම කළ යුතු විය. එහෙත් එම කාර්යයන් සිදුකර තිබුණේ ලැබෙන පැමිණිලි සඳහා පමණක් විය. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව කාර්යයන් ඉටු කළ යුතුවේ. | පවත්නා කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මේ සඳහා හේතු වී ඇති අතර මාර්ගගත පරීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වාදෙමින් ලංසු ඇගයීමේ කමිටුවක සාමාජිකයකු වීම සඳහා ලබාගත යුතු අවම සුදුසුකම් මට්ටමක් හඳුන්වාදීම අපේක්ෂා කෙරේ. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| i. මුදල් රෙගුලාසි 835(2)(උ) | පවත්නා වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා යන පරිදි කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගෙන තිබූ අතර පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එකඟ වෙමි. |
| ii. මුදල් රෙගුලාසි 835(3) | කොමිෂන් සභාව විසින් ගොඩනැගිලි හිමිකරු සමඟ ඇතිකර ගත් ගිවිසුමේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් | - එම - | කාර්යාලීය ප්‍රමාදයක් බැව් කණගාටුවෙන් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණි. | | |
| (ඇ) **2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | නියමිත පරිදි ආයතනයේ සමස්ථ කාර්යමණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර නොතිබුණු අතර කාර්යමණ්ඩලයේ පවතින නිපුනතා හා පැවතිය යුතු නිපුනතා අතර පරතරය හඳුනාගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක්ද සකස්කර නොතිබුණි. තවද විධිවිධාන ප්‍රකාරව සෑම කාර්යමණ්ඩල සාමාජිකයකුටම වාර්ෂිකව පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් සහතික විය යුතු වුවද 2018 දෙසැම්බර් 31 දිනට ආයතනයේ වූ 27 දෙනෙකුගෙන් යුත් ස්ථිර කාර්යමණ්ඩලයේ සාමාජිකයින් 06 දෙනෙකු සඳහා පමණක් පුහුණු අවස්ථා සලසා තිබුණි. | මානව සම්පත් සංවර්ධනය සඳහා විධිමත් පියවර ගත යුතුවේ. | එකඟ වෙමි. කමිෂන් සභාව අලුතෙන් ස්ථාපිත කරන ලදී. එබැවින් මෙම කාර්යයන් අතපසුවී ඇත. ඉදිරියේදී එපරිදි ක්‍රියාකරන බව දන්වන අතර නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා පියවර ගෙන ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයයන් 05 ක මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර වෙනස මූලික වියදම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 50 සිට සියයට 332 අතර පරාසයක විය. | හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුවේ. | විදුලිය හා ජලය සඳහා ප්‍රතිපාදන නොතිබීම, මෙහෙයුම් කල්බදු චක්‍රලේඛය 2018 වර්ෂයේදී අවලංගු කිරීම, කුලී ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම, බත්තරමුල්ල නව ගොඩනැගිල්ලේ සිදු කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු හා දුරකතන පද්ධති ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමානවත් නොවීම සහ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පාර්ලිමේන්තුවේ සම්මත වීම ප්‍රමාද වීම නිසා පුහුණු වැඩමුළු නොපැවැත්වීම වැනි හේතු නිසා මෙම වෙනස්කම් සිදු වී ඇත. |
| (ආ) වැය විෂයයන්ගේ 11 ක් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව රු.15,642,000 ක් වූ | - එම - | කොමිෂන් සභාවේ කාර්යයන් අපේක්ෂිත ආකාරයෙන් 2018 වර්ෂය තුල සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි |

| | | |
|---|---|---|
| අතර වියදම රු.7,306,643 ක් වූයෙන් ඉතිරිවීම් රු.8,335,357 ක් විය. මෙම ඉතිරිවීම් වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 32 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | | වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතනයේ මෙහෙවරට අදාලව ඉදිරිපත් කර තිබූ භාණ්ඩ, වැඩ හා සේවා, තොරතුරු පද්ධති හා උපදේශකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ මගපෙන්වීම් සඳහා 2019 මැයි මාසය වනවිටත් පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට නොහැකිවී තිබුණි. | අදාල මෙහෙවර ඉටුකිරීම සඳහා බලය පැවරෙන නීතිමය රාමුව සකස් වියයුතු වේ. | මෙම ක්‍රියාවලිය ප්‍රමාදවීම ප්‍රසම්පාදන කොමිෂන් සභාවට කිසිසේත් වලක්වා ගත නොහැකි හේතූන් මත සිදුවී ඇති බව දන්වනු කැමැත්තෙමි. |

### 3.2 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් විය යුතු අභ්‍යන්තර විගණන සැලැස්ම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල විස්තර යනාදී තොරතුරු ඇතුළත්ව නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඇතුලත් විය යුතු කරුණු ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් විය යුතු වේ. | අභ්‍යන්තර විගණනවරයෙකු මෙම ආයතනයට අනුමත වී නොමැති නිසා අභ්‍යන්තර විගණනයක් සිදු නොවන අතර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, සංවිධාන ව්‍යුහය හා කාර්යමණ්ඩලය යනාදී ලේඛනවල පිටපත් අමුණා ඇත. |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබූ පහත දැක්වෙන කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී සාර්ථක ලෙස ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | | |
| (අ) විධායක ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීම. | සැලසුම් කළ කාර්යයන් නියමිත කාල රාමුව තුල ඉටු කළ යුතුය. | නීති නිලධාරී තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටිය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යවා ඇති බව. |
| (ආ) 2018 වර්ෂය සඳහා සියළුම අමාත්‍යාංශවලින් ක්‍රියාකාරී සැලැසුම් හා ප්‍රසම්පාදන සැලසුම් රැස් කිරීම. | - එම - | එකඟ වෙමි. අමාත්‍යාංශ 43 න් 54 ක් ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කර ඇත. අනෙකුත් අමාත්‍යාංශවල ප්‍රගතිය දුර්වල මට්ටමක පවතී. |
| (ඇ) ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවේද යන්න පරීක්ෂා කිරීම. | - එම - | එකඟ වෙමි. තෝරාගත් අමාත්‍යාංශ 07 ක ඇති ආයතන 13 ක කටයුතු ප්‍රසම්පාදන සැලසුමට අනුකූලද යන්න පරීක්ෂා කර ඇත. සීමිත කාර්යමණ්ඩලය නිසා මෙම කාර්යය අපහසු වී ඇති අතර ඉදිරියේදී පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් 2018 වර්ෂය තුළදී ලැබී තිබුණු පැමිණිලි 151 කින් 67 ක් පරීක්ෂා කර වාර්තා නිකුත් කර තිබූ අතර 10 ක විමර්ෂණ කටයුතු අවසන් කර වාර්තා නිකුත් කර නොතිබුණි. 27 ක් තොරතුරු කැඳවීම්වලට පමණක් සීමාවී තිබුණි. | - එම - | එකඟ වෙමි. |
| (ඉ) කොමිෂන් සභා තීරණය මත ඇතැම් ප්‍රසම්පාදන ක්‍රියාවලි සවිස්තරාත්මකව පරීක්ෂා කිරීම. | | එකඟ වෙමි. මෙම ක්‍රියාවලිය බාහිර උපදේශකවරුන් මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. අවශ්‍ය ප්‍රතිපාදන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඉදිරියේදී අවශ්‍යතාවයන් |

අනුව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

- එම -

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉන්වෙන්ට්‍රි ලේඛනයේ හා පරිභෝජන භාණ්ඩ ලේඛනයේ සඳහන් කළයුතු භාණ්ඩ වෙන් වෙන්ව හඳුනාගෙන සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ භාණ්ඩ වර්ග වෙන් වෙන්ව හඳුනා ගැනීම තුළින් වත්කම් කළමනාකරණය පහසුකරවා ගත යුතුය. | යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට පෙර අදාල භාණ්ඩ ලැබී ඇති බව සනාථ කර ගැනීමට පහසුවන සේ භාණ්ඩ ලැබීම් සටහන් (GRN) නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට පෙර අදාළ භාණ්ඩ ලැබුණු බව සනාථ කර ගැනීමට ක්‍රමවේද සකස්විය යුතු වේ. | මිලදී ගන්නා ලද සියලුම භාණ්ඩ ලද පසු ඒවා ඉන්වෙන්ට්‍රි / පාරිභෝජ්‍ය ලේඛනයට ඇතුලත් කිරීමෙන් පසු පමණක් ඒකී භාණඩ වලට අදාල වවුචර පත් සඳහා ගෙවීමට ඉදිරිපත් කරයි. ඊට අමතරව ලැබීම් සඳහා GRN නිකුත් කිරීමද සිදු කරයි. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 ජූලි 31 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වාගෙන ගිය කොමිෂන් සභා කාර්යාලය සඳහා මාසික කුලිය රු.931,834 ක් වුවද බත්තරමුල්ලේ පිහිටා ඇති නව කාර්යාලීය ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.2,028,600 ක් විය. පැරණි කාර්යාලය පවත්වාගෙන යාමේදී දැරීමට සිදු නොවූ නමුත් නව කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලට පැමිණීම හේතුවෙන් විදුලිබලය, පවිත්‍රතා, ජලය හා ආරක්ෂක වැනි වියදම් සඳහා 2018 අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා මාස 05 ක කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.1,885,496 ක අතිරේක වැයක් දැරීමට සිදුව තිබුණි. | වැයවන මුදලට උපරිම කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිලි දෙකක ස්ථාන හයක මුලු ඉඩ ප්‍රමාණය වර්ග අඩි 2231 ක් වූ ඉඩ ප්‍රමාණයක ස්ථාපිත කර තිබූ අතර ඒ සඳහා වූ කුලිය මාසිකව වර්ග අඩියක් සඳහා රු.375.00 ක් විය.(බදු රහිත).<br>එය එවකට සිටි කාර්ය මණ්ඩලයටද ප්‍රමාණවත් නොවූ අතර කොමිෂන් සභාවේ සභාපතිතුමාටද භාවිතා කිරීමට සිදු වූයේ පොදු වැසිකිළි සහ පොදු ජල කරාම බැව් දන්වනු කැමැත්තෙමි. ඉඩ පහසුකම් අඩුවීම නිසා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා පිටතින් ඉඩකඩ සපයා ගැනීමටද කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමටද නොහැකි විය. කාර්යාල කටයුතු ඉටුකර ගැනීමේදී විවිධ ගැටලු උද්ගත විය. |
| (ආ) උක්ත ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා 2017 සැප්තැම්බර් 29 දිනැතිව පළකර තිබූ පුවත්පත් දැන්වීමේ සඳහන් පරිදි අවශ්‍ය ඉඩ ප්‍රමාණය වර්ග අඩි 6000 ක් ලෙසද, 2018 ජනවාරි මාසයේ පළකර තිබූ දැන්වීම අනුව අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණය 8500-10500 ක් අතර ප්‍රමාණයක් ලෙසද සඳහන් කර තිබුණි. තවද කොමිෂන් සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසා තිබුණේ වර්ග අඩි 1500-2000 අතර ඉඩ ප්‍රමාණයක් පිළිබඳව වේ. කෙසේ වුවද දැනට කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිල්ල වර්ග අඩි 13400 ක් වූ අතර අනුමත කාර්ය මණ්ඩලය 50 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 27 ක් පමණක් විය. එහෙත් කොමිෂන් සභාව සඳහා වර්ග අඩි 13,400 ක ප්‍රමාණයම වර්ග අඩි 12,000 ක් වෙනුවෙන් වර්ග අඩියක් සඳහා | - එම - | ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය වර්ග අඩි 8500 – 10500 කට ආසන්න විය යුතු බව හා වාහන 10ක් වත් ගාල් කිරීමේ හැකියාව ද සලකා බලන ලදී.<br>මහල් වෙන්කොට භාවිතයට ගැනීම ගැටළු සහිත විය හැකි බව හා කුලී මුදලේ සාධාරණභාවයත් සලකා මුළු ගොඩනැගිල්ල කුලියට ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | (එකතු කළ අගය මත බදු රහිත මිලට) රු.147 බැගින් මාසිකව ගෙවීම් කර ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන තිබුණි. | | |
| (ඇ) | නව ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර තිබුණ තක්සේරු වාර්තාව අනුව මාසික කුලී වටිනාකම රු.1,600,000 ක් වූ අතර මෙම තක්සේරුව ඉක්මවා මාසයක් සඳහා ගෙවන කුලී මුදල රු.164,000 ක් විය. ඒ අනුව වර්ෂයක් සඳහා එසේ වැඩිපුර ගෙවීමට සිදුවන මුදල රු.1,968,000 ක් බව නිරීක්ෂණය විය. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන තක්සේරු වාර්තා පදනම් කරගෙන කුලී ගෙවීම් කළ යුතුය. | නව ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකමත් ගොඩනැගිලි හිමිකරු විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් වලත් වෙනසක් ඇති බව පිළිගනිමි. ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ වැදගත්කම සහ අවට කාර්යාල වල කුලිය සැලකිල්ලට ගෙන එම කුලිය සැලකිය යුතු කරුණක් සේ නොසලකා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී. |
| (ඈ) | 2018 වර්ෂයේදී කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් රියදුරන් දෙදෙනෙකු සිටි නමුත් එක් වාහනයක් පමණක් කොමිෂන් සභාව සතුව පැවතුණි. එහෙත් ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවන රියදුරෙකුට කොමිෂන් සභාවට අයත් නොවන වෙනත් වාහනයක් ධාවනය කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදයට මාසික දීමනා ලෙස රු. 311,456 ක් ද, 2018 මැයි, ජූනි හා ජූලි මාස වෙනුවෙන් අතිකාල දීමනා ලෙස රු. 18,072 ක් ද ගෙවා තිබුණි. ඒ වන විට ධාවනය කිරිමට වාහනයක් නොමැතිව සිටි ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් රියදුරෙකු සඳහා ද එම කාලපරිච්ඡේදය සඳහා වැටුප් හා අතිකාල දීමනා ගෙවා තිබුණි.<br>2018 මැයි හා ජූනි යන මාස සඳහා රියදුරුට දීමනා හා අතිකාල ගෙවා ඇති නමුත් උක්ත සඳහන් වාහනය පාවිච්චි කළ නිලධාරියා එම කාලය තුළ අසනීප නිවාඩු ලබා රාජකාරියට නොපැමිණි බවද වාර්තා වී තිබුණි. | පවතින සේවක සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හා අත්‍යවශ්‍ය නොවන වියදම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. නීත්‍යානුකූල නොවන හා හිමිකමක් නොමැති ගෙවීම් සිදු කර ඇති නිලධාරින්ගෙන් අදාල මුදල් නැවත රජයට අයකර ගත යුතුය. | 2018-08-01 දක්වා මෙම කොමිෂන් සභාව සතුව තිබූ වාහන ප්‍රමාණය එකක් වූ අතර ස්ථිර කාර්ය මණ්ඩලයේ රියදුරු දෙදෙනෙක් සිටින ලදී. එක් රියදුරෙකු සභාපතිතුමාටද අනෙක් රියදුරු එම රියදුරු නිවාඩු දිනවල සේවයේ යෙදවීමටත්, කටයුතු කර ඇත.<br>වෙනත් වාහනයක් නොමැතිවීම හේතුවෙන් පෞද්ගලික මෝටර් රථය පැදවීමට අනුමැතිය මත කොන්ත්‍රාත් පදනමට බඳවා ගන්නා ලද රියදුරු මහතා තාවකාලිකව සේවයට යොදවා ගන්නා ලදී.<br>මහලේකම් හෘද සැත්කමකට භාජනය වීම නිසා අදාළ වෛද්‍යවරයා විසින් 2018-**04-30** සිට ජූලි 30 දක්වා නිවාඩු අනුමත කරනු ලැබුවද මහලේකම් 2018-05-22 නැවත සේවයට වාර්තා කර ඇති බැව් දන්වමි. |

| | | |
|---|---|---|
| (ඉ) කොමිෂන් සභා කාර්යාලය පිහිටි කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලේ ඉඩපහසුකම් වෙන්කිරීමේ කටයුතු සහ දුරකථන සවිකිරිම ආදිය වෙනුවෙන් අවස්ථා 06 කදී දරන ලද රු.7,338,205 ක මුදල අංක 024-01-01-2001 (ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්) දරන ප්‍රාග්ධන වැය විෂයය යටතේ දරා තිබූ බව නිරීක්ෂණය විය. එහෙත් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක් සඳහා දරා ඇති මෙම වියදම තුලින් රජයේ වත්කම් වැඩිදියුණු වීමක් සිදුවී නොමැති බැවින් එය ප්‍රාග්ධන වියදම් ලෙස සැලකීම ප්‍රශ්නගත කරුණක් විය. තවද අවම පිරිවැයක් යටතේ එම කාර්යයන් සිදුකර ඇති බවක්ද නිරීක්ෂණය නොවීය. | වත්කම් වැඩිදියුණුවීමක් සිදු නොවන බැවින් පිරිමැසුම්දායක ලෙස අවම පිරිවැයක් යටතේ අත්‍යාවශ්‍ය කටයුතු පමණක් සිදුකළ යුතුය. | මුළු ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය අභ්‍යන්තර දුරකථන පද්ධතියක් සවිකිරීම සහ සෑම මහලකට කාර්යාලීය කටයුතු විස්තාරණය වන පරිදි අවශ්‍ය උපරිම බාහිර දුරකථන පහසුකම් ලබාදීමට හැකිවන සේ ඊට අවශ්‍ය පුඩු (loop) සවිකිරීම**,** ජාලගත කිරීම වැනි කටයුතු මෙන්ම 05 සහ 04 වන මහල් මනාව බෙදා වෙන් කිරීම සඳහා වන වියදමට මෙම වියදම තුල අන්තර්ගතව ඇත. එකී වියදම කාර්යාල වෙන් කිරීම සඳහා පමණක් වූ වියදමක් වශයෙන් සැලකිය නොහැක**.** |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව තිබුණි. එහෙත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව තම විෂය පථයට ගැනෙන කරුණු සම්බන්ධයෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැනබැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | සෑම රාජ්‍ය ආයතනයක්ම තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව කටයුතු කළ යුතුය. | තිරසර සංවර්ධනයට අදාල අරමුණු 17 සාක්ෂාත් කර ගැනීමට අදාල ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්යයට අදාලව රාජ්‍ය ප්‍රසම්පාදනයෙන් ඉටුවන කාර්යයභාරය සැලකිල්ලට ගෙන ඉහත අරමුණු ළඟාකර ගැනීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අත්පොත්වල කෙටුම්පත් සකස්කර ඇත. මෙම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අත්පොත්වල කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වෙතත් තිරසර සංවර්ධනයට අදාල අරමුණු 17 සැලකිල්ලට ගැනීමේදී ජාතික ප්‍රසම්පාදන කොමිෂමේ කාර්යභාරය එක් අරමුණකට හෝ කිහිපයකට සීමා කල නොහැකි බවත් එකී අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වමි. |

**5. යහපාලනය**

**-------------**

**5.1 අභ්‍යන්තර විගණනය හා විගණන හා කළමනාකරණ කමිටු**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වන වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණු අතර පනතේ 41(1) වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුද පවත්වා නොතිබුණි. | පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වීම හා විධිමත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම. | අභ්‍යන්තර විගණකයෙකු පත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

**6. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 51 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 27 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයේ ඇති තනතුරු 07 ක කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයින් සේවය කරන බවද නිරීක්ෂණය විය. | අදාල පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ. | එකඟ වෙමි. |